# දරුවන් උදෙසා බයිබලයක්



# ජේසුස් වහන්සේට භයානක කාලයක්

**ඉදිරිපත් කරන්නා**: Edward Hughes

**නිදර්ශනය කරන්නා**: Byron Unger; Lazarus Alastair Paterson

**සකස්කරන්නා**: M. Maillot; Sarah S.

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා**: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**



ජේසුස් වහන්සේ බව්තීස්මය ලබන විට දෙවියන් වහන්සේ කතා කළසේක. “මේ මාගේ ආදරණීය පුත්‍රයාය. මම ඔහු ගැන ඉතා සතුටු වෙමි” යි උන්වහන්සේ කී සේක. දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මය පරවියෙකු ගේ රූපයෙන් ජේසුස් වහන්සේ වෙතට පහළ වූ සේක.




එසේ වූ පසු ඉක්මණින්ම දෙවියන් වහන්සේ ගේ ශුද්ධාත්මය ජේසුස් වහන්සේව පාළුකරයකට ගෙනගිය සේක. ජේසුස් වහන්සේ තනිවම සිටි සේක.
3
ජේසුස් වහන්සේ දවස් හතළිහක් නිරාහාරව සිටි සේක. එහි අදහස නම් උන්වහන්සේ කිසිම ආහාරයක් නොගත් බවය. එතුමන්ට බොහෝ සේ බඩගිනි විය.
4
ශුද්ධ බයිබලය සඳහන් කරන ලෙසට එහි වන මෘගයන් පවා හිඳ ඇත.
5
සාතන් ජේසුස් වහන්සේ පොළඹවනු සඳහා ආවේය. බොහෝ කලකට පෙර ඔහු ආදම් සහ ඒව දෙදෙනාවත් ඒදන් උයනේදී දෙවියන් වහන්සේට අකීකරු වනු සඳහා පොළඹවන්නට ආවේය. දැන් ජේසුස් වහන්සේ පරීක්ෂාවට මුහුණ දෙනු ඇත.
6
සාතන්ට දෙවියන් වහන්සේගේම පුත් ජේසුස් වහන්සේ පවා පොළඹවන්න උත්සහ කළ හැකිව තිබුනි.
7
“ඔබ දෙවියන් වහන්සේගේ පුතා නම් මේ ගල් රොටි බවට හරවන්නයැ” යි යක්ෂයා කීවේය. ජේසුස් වහන්සේ බඩගින්නේ හිඳින බව ඔහු දැන සිටියේය. දෙවියන් වහන්සේගේ පුත්‍රයාට ගල්, රොටි බවට හැරවිය හැකි බවත් ඔහු දැන සිටියේය. ජේසුස් වහන්සේ යක්ෂයාට කීකරු වේවිද?
8


නැත! ජේසුස් වහන්සේ යක්ෂයාට කීකරු නොවූ සේක. ඒ වෙනුවට උන්වහන්සේ දෙවියන් වහන්සේ ගේ වචනයෙන් පිළිතුරු දුන් සේක. “මිනිසා රොටි වලින් විතරක් ජීවත් නොවෙයි, නමුත් දෙවියන්වහන්සේ ගේ මුවින් පිටවෙන හැම වචනයකින් පමණක් මිනිසා ජීවත් වන්නේය”.
ශුද්ධවූ බයිබලය
9
ඉන්පසු සාතන් ජේසුස් වහන්සේව ජෙරුසලම් මහා නගරයේ, මිනිසුන් දෙවියන් වහන්සේට නමස්කාර කරන ශුද්ධවූ දේව මාළිගාවට ගෙන ගියේය. ඉන්පසු යක්ෂයා කුමක් කරාවිද?
10
ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න. දෙවියන් වහන්සේගේ දේවදූතයෝ ඔබව බේරා ගන්නා බව දේව වචනයේ තිබේයැ”යි යක්ෂයා කීය.
11
“නැත!” ජේසුස් වහන්සේ පිළිතුරු දුන් සේක. “ඔබේ ස්වාමින් වූ දෙවියන් වහන්සේ පරීක්ෂා නොකරව කියාද එහි ලියා තිබේ”.
ශුද්ධවූ බයිබලය
12
යක්ෂයා නැවතත් උත්සහ කළේය. ඔහු නගරයෙන් පිටත තිබූ ඉතා උස් කඳු මුදුනකට ජේසුස් වහන්සේ ගෙන ගියේය.
13
ජේසුස් වහන්සේ හට පොළොවේ සෑම රාජධානියකම මහිමය පෙන්වූ යක්ෂයා “ඔබ මට දණ නමා නමස්කාර කළොත් මේ සියල්ල ඔබට දෙන්නෙමි” යි ජේසුස් වහන්සේට කීවේය.
14

“මගෙන් ඉවතට යව සාතන්! ඔබේ ස්වාමි වූ දෙවියන් වහන්සේ ට පමණක් නමස්කාර කරව, උන්වහන්සේට පමණක් සේවය කරව කියා ලියා තිබේයැ” යි ජේසුස් වහන්සේ කී සේක.




15

යක්ෂයා මද වේලාවකට ජේසුස් වහන්සේ අත්හැර ගියේය. එවිට ඉතා අපූරු දෙයක් සිදුවිය. යක්ෂයාට කීකරු නොවූ තම පුත්‍රවූ ජේසුස් වහන්සේ සනසන්ටත් රැකගන්ටත් දෙවියන් වහන්සේ දේවදූතයන් එවූ සේක.



16

ජේසුස් වහන්සේට භයානක කාලයක්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මතෙව් 4, ලූක් 4

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

17

# අවසානය

38

60

18

**මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.**

**දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.**

**මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.**

**ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.**

**දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)**

19